WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ] All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II | | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I, II | | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I, II | | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** අයියා **ඇඟිලි ගනිමින් සිටින්නේ** රැකියාවක් ලැබෙන තුරු ය.

(1) නිකම් බලා සිටින්නේ
(2) මහත් බලාපොරොත්තුවෙන් සිටින්නේ
(3) දින සති ගෙවමින් සිටින්නේ
(4) නිවසට වී කල් යවන්නේ

**2.** වරදක් සිදු කර **කොළේ වහන එක** යහපත් දෙයක් නොවේ.

(1) සඟවාගෙන සිටීම
(2) ආපසු හැරී සිටීම
(3) බොරු ප්‍රචාරය කිරීම
(4) නොපිළිගෙන සිටීම

**3.** නංගී **තකහණියෙන්** ම ආවේ අම්මාට යමක් කීමට ය.

(1) බියේ ගැහෙමින්
(2) සිනාසෙමින්
(3) කෑගසමින්
(4) ඉක්මනින්

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** භාෂාවේ පරිණාමය පිළිබඳ කතාව රසවත් ............................ කි.

(1) පර්යේෂණය (2) විමර්ශනය (3) වෘත්තාන්තය (4) සම්මර්ශනය

WWW.OLEVELAPI.COM

**5.** 'ශ්‍රී ලංකාවේ ගොන්ඩ්වානා තැන්පතු' නම් ලිපිය ජුරාසික පොසිල පිළිබඳ ලියැවී ඇති ශාස්ත්‍රීය ..................... කි.

(1) වාර්තාව (2) මූලාශ්‍රය (3) ප්‍රකාශය (4) ජනප්‍රවාදය

**6.** ලේඛකයාගේ ..................... වී ඇත්තේ සමාජය යහමගට ගැනීමට උපකාර වන පණිවුඩයක් තම කෘතිය මගින් පාඨකයාට ලබාදීමයි.

(1) අභිමානය (2) ප්‍රාර්ථනය (3) සම්ප්‍රදාය (4) අභිප්‍රාය

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.

(1) රත්තරන්, රදාවාන, රාස්සගල, රබාන
(2) ඉතාලිය, ඉතියෝපියාව, ඕලන්දය, චීනය
(3) සමාජය, සාහිත්‍යය, හාස්‍යය, චමත්කාරය
(4) විදග්ධ, විශේෂ, විශාල, සොම්නස

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.

(1) ප්‍රකාශන විලාසය, අතීතාවර්ජනය, ප්‍රතිබිම්භය, පෘෂ්ඨීමත්
(2) සුභාසිංසනය, කාව්‍යශේඛරය, අභ්‍යවකාශය, කළමණාකරණය
(3) ධාරාණිපාත, උපාධි ප්‍රදානය, සැලසුම, සාමර්ථ්‍යය
(4) ප්‍රවර්ධනය, ව්‍යවස්ථාව, උත්කෘෂ්ටාලංකාර, පාරිභෝගිකයා

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. **යංශය, රකාරාංශය, රේඵය** සහ **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
   (1) ත්‍යාග, ප්‍රසාද, තර්ක, කෘශ (2) කෘශ, ප්‍රසාද, තර්ක, ත්‍යාග
   (3) තර්ක, කෘශ, ත්‍යාග, ප්‍රසාද (4) ප්‍රසාද, තර්ක, කෘශ, ත්‍යාග

10. 'තාරපති' යන වචනය අයත් වන්නේ,
   (1) විශේෂණ සමාසයට ය. (2) ද්කාරාර්ථ සමාසයට ය.
   (3) අන්‍යාර්ථ සමාසයට ය. (4) විභක්ති සමාසයට ය.

11. ඇය දෙවඟනක මෙන් රූමත් ය. යන වාක්‍යයේ 'මෙන්' යනු,
   (1) නාම පදයකි. (2) විශේෂණ පදයකි.
   (3) උපසර්ගයකි. (4) නිපාත පදයකි.

12. 'අසමින්' යන ක්‍රියා පදයේ 'අස' යනු,
   (1) ධාතු ප්‍රකෘතියකි. (2) ප්‍රත්‍යයකි. (3) නිපාතයකි. (4) විශේෂණයකි.

13. මගීහු **දුම්රිය මාර්ගයෙන්** ඉවත් වූහ. යන වාක්‍යයේ 'දුම්රිය මාර්ගයෙන්' යන්න,
   (1) සම්ප්‍රදාන විභක්තියට අයත් වේ. (2) කර්තෘ විභක්තියට අයත් වේ.
   (3) අවධි විභක්තියට අයත් වේ. (4) ප්‍රථමා විභක්තියට අයත් වේ.

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. සන්නිවේදන **ශක්‍යතාව**, භාෂාව නිසා මිනිසාට ලැබුණු උරුමයකි.
   (1) හැකියාව (2) මාර්ගය (3) පුරුද්ද (4) ප්‍රබලතාව

15. එම නිර්මාණයේ **මුඛ්‍යාර්ථය** වූයේ ජනතාව තුළ දේශානුරාගය ඇති කිරීමයි.
   (1) මූලික ආදර්ශය (2) මූලාරම්භය
   (3) ප්‍රමුඛ තත්ත්වය (4) මූලික අදහස

16. සුළි සුළඟින් **අවිනෂ්ට** වූ දේවල් දැක අපි පුදුම වූයෙමු.
   (1) විනාශයට පත් වූ (2) විනාශයට පත් නොවූ
   (3) ප්‍රතිසංස්කරණය කළ (4) විකෘත වූ

17. පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.
   කැහැටු, කළටි, පහටි
   (1) තද්ධිත (2) කෘදන්ත
   (3) නිපාත (4) රූඪී

18. පද කිහිපයක් කැටි කොට ගැනීමෙන් තනි පදයක් බවට සකස් වීම,
   (1) තද්ධිත නාමයි. (2) සමාස නාමයි. (3) කෘදන්ත නාමයි. (4) සර්ව නාමයි.

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
   (1) අංජන - අඳුන්, අත්සුණු - අග්ගළා, අග්‍ර - පරම, ගද්‍ය - ගැදි
   (2) ආනන්දය - ප්‍රමෝදය, එකලා - තනි, දැමිටු - ධර්මිෂ්ඨ, මන්දස්මිතය - මඳ සිනහව
   (3) රජ - නරේන්ද්‍ර, කඩුව - කග, රවි - දිවාකර, වියළි - ශුෂ්ක
   (4) සකසුරුවම - අරපරෙස්සම, ඉඳුදුනු - දේදුන්න, පාසඟල - සරණයුග, විකසිත - මුකුලිත

WWW.OLEVELAPI.COM

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
   (1) අලංකාර - භූෂණ (2) කුටිල - වංක
   (3) අභිවෘද්ධිය - පරිහානිය (4) බුහුමන - අවමන

21. 'භාෂාවේ උපත සම්බන්ධයෙන් මත කිහිපයක් පළ වී තිබේ.' යන වාක්‍යයේ 'උපත' යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් ම යෝග්‍ය පදය කුමක් ද?
   (1) ප්‍රතිලාභය (2) සම්භවය
   (3) පුනරුප්පත්තිය (4) පරිණාමය

22. වෙළෙන්දා පොළට ගොස් බඩු ගනිද්දී මිතුරෙක් පිටට තට්ටු කළේ ය.
   ඉහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියාපද පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.
   (1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
   (2) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
   (3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
   (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

23. **වැරදි** අදහස දෙන වාක්‍යය තෝරන්න.
   (1) කුකවි යනු අව්‍යය සමාසය සඳහා නිදසුනකි.
   (2) බුජ බල යන්නෙහි අර්ථය බාහු ශක්තිය යන්නයි.
   (3) 'කියග මහිය එනු කොහි සිට' යන වාක්‍යයේ කියග යනු පූර්ව ක්‍රියාවකි.
   (4) අනුජාත යන වචනයේ අනු යනු උපසර්ගයකි.

24. ස්වරාදේශ සන්ධියට උදාහරණයක් **නො වන්නේ** කුමක් ද?
   (1) දැත (2) අරුණෝදය (3) මහේශ්වර (4) පලාපල

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
   (1) ග ය ම් හෙ ළි ර (2) යෝ ක ම රු ක් ගා ර (3) න ව බා ධ න ත් (4) හෙ මා යි ය රු ම් ව

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. කිසිම ආකාරයකින් නිදහසක් නොමැති වීම
   (1) ඉස රුදාවට කොට්ටෙ මාරු කළා වගේ (2) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
   (3) ගිරයට අහු වුණු පුවක් ගෙඩිය වගේ (4) කම්මලේ ඉන්න බල්ලා වගේ

27. තමන් කළ වැරැද්ද තමන්ට ම දැනීම
   (1) අබ කෑ මිනිහාගේ නහය දනවා වගේ (2) අනුන්ට කැපූ වළේ තමන් වැටුණා වගේ
   (3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ (4) අටුවෙන් දුමට පැන්නා වගේ

28. A - ජයතිස්ස සහ රොසලින් - මාර්ටින් වික්‍රමසිංහ
   B - නොලසා - ශීඝ්‍රාර්ථයේ නිපාත
   C - පරිණාමවාදය - ක්‍රමක ක්‍රමික විකාශනය
   D - අටු කොටු - යුගල පද

   A, B, C, D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
   (1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) මා විභාගයෙන් සමත් වෙති'යි සියලු දෙනා සිතයි.
   (2) ශිෂ්‍යයන් කෝලාහලයට සම්බන්ධ නැත.
   (3) මිනිස්සු විසින් ගස්වැල් ආරක්ෂා කරනු ලබයි.
   (4) නාය යෑමෙන් සතුන් ද මිනිසුන් ද කරදරයට පත් විය.

30. (1) සියලු නළුනිළියෝ වේදිකාවේ රඟපානු ඇත.
   (2) ළමයි ප්‍රවීණයන් මෙන් රංගනයේ යෙදුණහ.
   (3) ඔවුන් දක්ෂ ක්‍රීඩකයෝ ද?
   (4) අපි රෝගීන්ට උවටැන් කරනු වෙමු.

31. **පරිත්‍යාගශීලීහු** තම ආධාර විපතට පත්වූවන්ට බෙදා දූන්හ.
   මතින් තොරවී නිරෝගීව **ජීවත් වන්න.**
   ඔහු **නරියකු** මෙන් කපටි ය.
   ප්‍රධානියා ලේකම්වරිය ලවා ලිපියක් **ලියවයි.**
   ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනුඅංගවල අනුපිළිවෙළ කුමක් ද?
   A - උක්ත කර්තෘ
   B - අනුක්ත කර්මය
   C - ප්‍රයෝජ්‍ය ක්‍රියා
   D - විධි ක්‍රියා

   (1) A,B,D,C (2) A,C,D,B (3) A,D,B,C (4) B,A,C,D

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
   "අපි ගායකයන් එක්ක කතාබහ කළා."
   (1) අපි ගායකයන් සමග කතාබහ කළෙමු.
   (2) අප ගායකයන් සමග කතාබහ කළෙමු.
   (3) ගායකයෝ සමග අපි කතාබහ කළෝ ය.
   (4) ගායකයෝ සමග අපි කතාබහ කළෙමු.

[හතරවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**33.** ඇරැව්වල නන්දිමිත්‍ර මහතාගේ නිර්මාණයක් වන්නේ,
(1) සෙංකොට්ටං
(2) වතුර මල
(3) වක්කඩ බඳිමු
(4) පියසේන ඇසූ ප්‍රශ්නයක්

**34.** රූපකයක් සහිත පාඨය තෝරන්න.
(1) මේ නේත්‍රද්වය නිසා ඈ සුනේත්‍රා නම් වන්නී ය. ඒ වර්ණයෙන් හා දීප්තියෙන් ඉඳුනිල්මිණි රුවනක් බඳු ය.
(2) සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් සියලු නුවර රැසින් සැදෙත් සැදෙත් ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත්
(3) නානාවිධ විහඟ ගණයාගේ මධුර ඣංකාර කූහකූහාරව ගුමුගුමාරවාදීන් කන්කලු වූ සුපුෂ්පිත වැකොඳ තමාලලතාදි
(4) හේ මල්පෙති යුවළක්ව දෙතොලින් ආවරණය වුව ද සිනාසෙන කල පුෂ්පගර්භයක් මෙන් විකසිත වන බැවින් සිනහවට ම සැදුණු මුව පියුමෙකැයි කිව යුතු

**35.** තලමල පිපිලා, ගුරුතරුව, සඳගිර යන නාට්‍යවල නිර්මාණකරුවා වන්නේ,
(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(2) ගුණසේන ගලප්පත්ති ය.
(3) ජයලත් මනෝරත්න ය.
(4) හෙන්රි ජයසේන ය.

**36.** පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න.

"වලාකුළේ රත් පාටට විදුලි කොටනවා
ආකාසේ හඬ තලමින් අකුණු හඬනවා
බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා
........................................................."

(1) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
(2) කළු වලා කැලඹෙමින් මුදුන් වී නැඟෙනවා
(3) හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා
(4) වහිනවා වහිනවා වහිනවා වහිනවා

**37.**
"රත්න දීප ජන්මභූමි
ලංකාද්වීප විජයභූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි"

ඉහත සඳහන් වන්නේ ලංකාවේ ප්‍රසිද්ධ ගීතයක කොටසකි. එම ගීතයේ පදරචකයා වන්නේ,
(1) මහගමසේකර ය.
(2) රත්න ශ්‍රී විජේසිංහ ය.
(3) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ය.
(4) ඩබ්. ඒ. අබේසිංහ ය.

**38.** ධීවර ජනවහරේ දී ජම්පර කළුව වශයෙන් හඳුන්වන්නේ,
(1) වර්ෂාවයි.
(2) වැහිකබායයි.
(3) මාළු දැලයි.
(4) සන්ධ්‍යා කාලයයි.

**39.**
නුබ සා මඬුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සඳ මල් කැනක සිරි ගත
තර පතරින් සඳ'දර තර පහර දෙත
දිවගත එව් බියෙනැ'ලළෙමිනි දස අත

WWW.OLEVELAPI.COM

යන කවියෙන් කියැවෙන්නේ,
(1) වනාන්තරයක අසිරිය පිළිබඳව ය.
(2) වර්ෂා කාලයක් පිළිබඳව ය.
(3) උදෑසන පිළිබඳව ය.
(4) සන්ධ්‍යා කාලයක් පිළිබඳව ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

"ලංකාව තුළ ස්වාධීන සභ්‍යත්වයක මුල් බිජුවට සිටුවන ලද්දේ දිවයිනේ ජනාවාස කිරීමට මුල් වූවා සේ සැලකෙන විජය රජු විසින් නොව පළමු වැව කරවූ පණ්ඩුකාභය රජු විසිනි."

(1) නිදහස් ලංකාවක සංස්කෘතියේ ආරම්භය ඇති කළේ විජය රජු නොව පණ්ඩුකාභය රජු ය.
(2) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සිදු කළේ විජය රජු නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජු ය.
(3) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සටහන් වන්නේ විජය රජුගෙන් නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජුගෙනි.
(4) විජය රජු ලංකාව ජනාවාස කළත් ලංකාවේ නිදහස් සභ්‍යත්වයක ආරම්භය සිදු වූයේ පණ්ඩුකාභය රජු කරවූ පළමුවන වැව නිසා ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....